# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2041/28 - 2017 ඔක්තෝබර් මස 20 වැනි සිකුරාදා - 2017.10.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**2017 අංක 10 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3(1) වගන්තිය යටතේ දැන්වීම**

මෑත අතීතයේදී ත්‍රස්තවාදී සටන්කාමී හෝ වෙනත් කණ්ඩායමක යම් ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් වශයෙන් අභ්‍යන්තරව අවතැන් වූ හා වෙනත් ස්ථානයක ඡන්ද හිමියන් ලෙස ලියාපදිංචි නොවූ ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා වූ පරිපූරක ලැයිස්තුව - 2017

ඉහත කරුණට අදාළ පරිපූරක ලැයිස්තුව, සකස් කිරීමට අදාළ අයදුම්පත් කැඳවීම 2017.10.19 දිනෙන් අවසන්ව ඇත. ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ විශේෂ විධිවිධාන පනත ප්‍රකාර එකී පරිපූරක නාමලේඛනයේ තම නම ඇතුළත් කරවා ගැනීමට සුදුසුකම් ඇත්තා වූ එහෙත් තම නම පරිපූරක ලැයිස්තුවේ ඇතුළත්ව නොමැති කිසිවෙකු විසින් තමාගේ නම නාමලේඛනයෙහි ඇතුළත් කරවා ගැනීම පිණිස හෝ තබා ගැනීම පිණිස හෝ අවස්ථාවෝචිත පරිදි තමා විසින් අභියාචනා ඉදිරිපත් කර සිටින්නේ නම් එසේ අභියාචනා ඉදිරිපත් කර සිටින අය විසින් ඒ බව යථෝක්ත ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත පරිදි හඳුන්වා දී ඇති ආකෘති පත්‍රයෙන් වූ ඉල්ලීමක් ඒ ඒ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරි තැන වෙත ඉදිරිපත් කළ යුතු ය. මෙම දන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට සති දෙකක් ඇතුළත (2017.11.02 දින දක්වා) මේ සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම ඒ ඒ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරි වෙත ලැබිය යුතු ය.

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ වූ පරිපූරක ලැයිස්තුවෙහි නම ඇතුළත්ව ඇත්තා වූ යම් කෙනෙකුට තමාගේ නම හෝ එකී නාමලේඛනයේ නම සඳහන් වී ඇත්තා වූ වෙන යම් නෙනෙකුගේ නමක් හෝ එකී නාමලේඛනයේ ඇතුළත්කර තිබීම ගැන හෝ තිබෙන්නට හැරීම ගැන හෝ විරෝධතාව දක්වා සිටීමට පුළුවන. එසේ දක්වා සිටින විරුද්ධතාව යථෝක්ත පනතේ නියම කර ඇති පරිදි අවස්ථාවෝචිතව ''ඇ'' ආකෘතියට සාරානුකූලව පිටපත් දෙකකින් යුක්ත කොට, ඒ ඒ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරි තැන වෙත ඉදිරිපත් කළ යුතුය. නාමලේඛනයේ නම ඇතුළත් කිරීම ගැන සඳහන් වනු ලබන සෑම විරුද්ධතාවක්ම අදාළ දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ දින සිට සති දෙකක් ඇතුළත (2017.11.02 දින දක්වා) ඒ ඒ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරි තැන වෙත ලැබෙන සේ එවිය යුතු ය.

යම් කිසි හිමිකමක් ඉදිරිපත් කිරීම සඳහා ද යම් කිසි කෙනෙකුගේ නමක් නාමලේඛනයේ ඇතුළත් කරන ලෙස හෝ තිබෙන්නට හරින ලෙස හෝ යම් කෙනෙකු විසින් කරනු ලබන හිමිකම් ඉල්ලීමක් සඳහා විරුද්ධතාව දැක්වීමට අවශ්‍ය ආකෘති පත්‍ර ඒ ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලින් ලබාගත හැකි ය.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

එච්. එම්. ටී. ඩී. හේරත්,<br>
ලේකම්,<br>
මැතිවරණ කොමිෂන් සභාව.

2017 ඔක්තෝබර් මස 20 වැනි දින,<br>
රාජගිරිය, මැතිවරණ කොමිෂන් සභාවේ දී ය.

11- 889/1


1A - G 26542 — 42 (2017/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**2017 අංක 10 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3(1) වගන්තිය යටතේ දැන්වීම**

මෑත අතීතයේදී ත්‍රස්තවාදී සටන්කාමී හෝ වෙනත් කණ්ඩායමක යම් ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් වශයෙන් අභ්‍යන්තරව අවතැන් වූ හා වෙනත් ස්ථානයක ඡන්ද හිමියන් ලෙස ලියාපදිංචි නොවූ ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා වූ පරිපූරක ලැයිස්තුව - 2017

**මැතිවරණ කොට්ඨාස අංකය සහ නම - 10 - යාපනය**

ඉහත දැක්වෙන මැතිවරණ කොට්ඨාසයට අදාළ වූ අවතැන් වූවන් සඳහා පරිපූරක ලැයිස්තුවේ වැඩ නිම කර ඇති බව සහ එම ලැයිස්තුව කාර්යාල වේලාවන්හිදී මහජනයාට පරීක්ෂා කර බලා ගැනීම පිණිස යාපනය/කිළිනොච්චි දිස්ත්‍රිත් මැතිවරණ කාර්යාලයේ තබා ඇති බව 2017 අංක 10 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3 (1) වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. යථෝක්ත අවතැන් වූ ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත ප්‍රකාර ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ වූ එකී පරිපූරක නාමලේඛනයේ තම නම ඇතුළත් කරවා ගැනීමට සුදුසුකම් ඇත්තා වූ එහෙත් තම නම පරිපූරක ලැයිස්තුවේ ඇතුළත්ව නොමැති කිසිවෙකු විසින් තමාගේ නම නාමලේඛනයෙහි ඇතුළත් කරවා ගැනීම පිණිස හෝ තබා ගැනීම පිණිස හෝ අවස්ථාවෝචිත පරිදි තමා විසින් අභියාචනා ඉදිරිපත් කර සිටින්නේ නම් එසේ අභියාචනා ඉදිරිපත් කර සිටින අය විසින් ඒ බව යථෝක්ත ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත පරිදි හඳුන්වා දී ඇති ආකෘති පත්‍රයෙන් වූ ඉල්ලීමක් යාපනය/කිළිනොච්චි මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරි තැන වෙත ඉදිරිපත් කළ යුතු ය. මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට සති දෙකක් ඇතුළත මේ සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම යාපනය/කිළිනොච්චි මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරි වෙත ලැබිය යුතු ය.

03. ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ වූ පරිපූරක ලැයිස්තුවේ නම ඇතුළත් ව ඇත්තා වූ යම් කෙනෙකුට තමාගේ නම හෝ එකී නාමලේඛනයේ නම සඳහන් වී ඇත්තා වූ වෙන යම් කෙනෙකුගේ නමක් හෝ එකී නාමලේඛනයේ ඇතුළත් කර තිබීම ගැන හෝ තිබෙන්නට හැරීම ගැන හෝ විරුද්ධතාවය දක්වා සිටීමට පුළුවන. එසේ දක්වා සිටින විරුද්ධතාව් යථෝක්ත පනතේ නියම කර ඇති පරිදි අවස්ථාවෝචිතව ''ඇ'' ආකෘතියට සාරානුකූලව පිටපත් දෙකකින් යුක්ත කොට, යාපනය/කිලිනොච්චිය මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී තැන වෙත ඉදිරිපත් කළ යුතුයි. නාමලේඛනයේ නම ඇතුළත් කිරීම ගැන සඳහන් වනු ලබන සෑම විරුද්ධතාවයක්ම මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන *රජයේ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ දින සිට සති දෙකක් ඇතුළත යාපනය/කිලිනොච්චිය මැතිවරණ කාර්යාලවල ලියාපදිංචි කිරීමේ නිලධාරී තැන වෙත ලැබෙන සේ එවිය යුතු ය.

මෙම දැන්වීම යාපනය/කිලිනොච්චිය මැතිවරණ කාර්යාලයේ 2017 ඔක්තෝබර් මස 20 වැනි දින සිට 2017 නොවැම්බර් මස 02 දින දක්වා (එම දිනයද ඇතුළත්ව) ප්‍රදර්ශනය කරනු ඇත.

04. යම්කිසි හිමිකමක් ඉදිරිපත් කිරීම සඳහා ද යම්කිසි කෙනෙකුගේ නමක් නාමලේඛනයේ ඇතුළත් කරන ලෙස හෝ තිබෙන්නට හරින ලෙස හෝ වෙන යම් කෙනෙකු විසින් කරනු ලබන හිමිකම් ඉල්ලීමක් සඳහා විරුද්ධතාව දැක්වීමට අවශ්‍ය ආකෘති පත්‍ර යාපනය/කිලිනොච්චිය පරිපාලන දිස්ත්‍රික්කයේ ඉහත සඳහන් මැතිවරණ කාර්යාලයෙන් ලබා ගත හැකිය.

ටී. අකිලන්,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,
මැතිවරණ කොට්ඨාසය අංක 10 - යාපනය.

2017 ඔක්තෝබර් මස 20 වැනි දින,
යාපනය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දී ය.

11 - 889/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.